# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2451/16 - 2025 අගෝස්තු මස 27 වැනි බදාදා - 2025.08.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය*: MUL/LND/02/ACQ/28.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය*: 4-3/5/2020/HA/21.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර* :-

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මුලටියන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බැරගම දකුණ ග්‍රාම නිලධාරි වසමට අයත් බැරගම දකුණ ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද 2025.04.03 දිනැති හා කැඩැස්තර සිතියම් අංක 820432 හි කලාප අංක 02, පත්‍ර අංක 1 හි කැබලි අංක 01 සහ 02 වශයෙන් පෙන්නුම් කර ඇති මුළු බිම් ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0312 ක් වූ පහත සඳහන් ඉඩම් කොටස්:

**කැබලි අංක 1**
ඉඩමේ නම: දොළමහ, ගල්ගොඩහේන; විස්තරය: ගෙවත්ත, මිශ්‍ර බෝග වගාවක් ඇත; හිමිකම් කියන අය: එච්. එච්. අමරසිරි; ප්‍රමාණය: හෙක්. 0.0030.

**කැබලි අංක 2**
ඉඩමේ නම: වතුරවලහේන සහ කෙටලකැටිය, ගල්ගොඩහේන; විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක්, ළිඳක් සහ වැසිකිළියක් ඇත; හිමිකම් කියන අය: ඉන්ද්‍රජිත් බාලසූරිය; ප්‍රමාණය: හෙක්. 0.0282.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම, තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින්, බලයලත් අයවලුන් හෝ 2025 ඔක්තෝබර් මස 13 වැනි දින, පෙ.ව. 10.00 ට මුලටියන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද 2025 ඔක්තෝබර් මස 07 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන්, ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, ඒකී ඉඩම/පරවශතාවය ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල සහ ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

**වින්ධ්‍යා ඩී. සමරක්කොඩි,**
ප්‍රාදේශීය ලේකම්,
මුලටියන.

2025 අගෝස්තු මස 13 වැනි දින,
මුලටියන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 08 - 0278

1A - G 045240 - 14 (2025/08) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*